මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: 2484500, 2484600, 2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: 2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: 2513459, 2513498, 2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: 2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல / My No

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date: **2018.10.10**

## ප්‍රවෘත්ති නිවේදනයයි

## ඉන්ධන මිල සූත්‍රය අනුව ඩීසල් මිල වැඩි නොකිරීමට රජය තීරණය කරයි

රජය විසින් ඉන්ධන මිල මාස්පතා තීරණය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද මිල සූත්‍රයට අනුව මෙවර ඩීසල් ලීටරයක මිල රු. 11 කින් වැඩිකළ යුතුව තිබූ නමුදු මහජනතාවට, විශේෂයෙන් ප්‍රවාහන, ධීවර වැනි ක්ෂේත්‍රයන්ට ඇතිවන්නා වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගෙන ඩීසල් මිල වැඩි නොකිරීමට රජය තීරණය කර ඇත.

බොරතෙල් මිල සඳහා පවතින ජාත්‍යන්තර මිල සහ ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතය පදනම් කරගෙන දේශීය වශයෙන් ඉන්ධන මිල තීරණය කිරීම සඳහා 2018 මැයි මස 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් මිල සූත්‍රයක් හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, සෑම මසකම 10 වන දින මිල සංශෝධනය කිරීම පිළිබඳ තීරණය ගැනීම සඳහා පත්කර ඇති මිල සූත්‍ර කමිටුවට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ප්‍රධානත්වය දරන අතර එම කමිටුවට ජනාධිපතිතුමාගේ නියෝජිතයෙක්, අග්‍රාමාත්‍යතුමාගේ නියෝජිතයෙක් සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ඇතුළු සාමාජිකයන් 05 දෙනෙක් අයත් වේ.

අවසන් වරට මිල සූත්‍රය අනුව සැප්තැම්බර් මස 10 වන දින ඉන්ධන මිල සංශෝධනය කළ අවස්ථාවේදී ඇ.ඩො. 75 ක්ව පැවැති බොරතෙල් බැරලයක මිල අද වනවිට ඇ.ඩො. 84 දක්වා වැඩි වී ඇත. ජාත්‍යන්තරව ඉන්ධන මිල සීමාවකින් තොරව ඉහළ ගියහොත් සංවේදී ආණ්ඩුවක් ලෙස එහි වැයබර දැරීමට රජය සූදානම් බව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මහතා ඊයේ පාර්ලිමේන්තුව අමතමින් පැවසීය. ඒ අනුව, ප්‍රවාහන සහ ධීවර ක්ෂේත්‍රයන්ට අහිතකර බලපෑමක් ඇති කළ හැකි බැවින් මෙවර ඩීසල් මිල වැඩි නොකිරීමට රජය තීරණය කරන ලදී.

ඔක්තෝම්බර් මස සඳහා මිල තීරණය කිරීමට රැස්වූ මිල සූත්‍ර කමිටුව විසින් අනෙකුත් ඉන්ධන මිල අද (10) බදාදා මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, රු. 149 ට අලෙවි කරන ඔක්ටේන් 92 වර්ගයේ පෙට්‍රල් ලීටරයක් රු. 6 කින් වැඩිකර ඇත.  රු. 161 ට අලෙවි කරන ලද ඔක්ටේන් 95 වර්ගයේ පෙට්‍රල් ලීටරයක් රු. 8 කින් සහ රු. 133 ට අලෙවි කරන ලද සුපර් ඩීසල් ලීටරයක් රු. 8 කින් ද වැඩිකරනු ලැබ ඇත.

**සංශෝධිත මිල දර්ශනය**

| **දිනය** | **ඉන්ධන වර්ගය** | **පවත්නා මිල ලීටරයක් (රු.)** | **සංශෝධිත මිල ලීටරයක් (රු.)** | **වැඩිවූ ප්‍රමාණය ලීටරයක් (රු.)** |
|---|---|---|---|---|
| 2018.10.10 | ඔටෝ ඩීසල් | 123 | 123 | වැඩිකර නොමැත |
| | ඔක්ටේන් 92 පෙට්‍රල් | 149 | 155 | 06 |
| | ඔක්ටේන් 95 පෙට්‍රල් | 161 | 169 | 08 |
| | සුපර් ඩීසල් | 133 | 141 | 08 |



එම්. අලි හසන්
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය